සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම - 2021
## Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 6 | |
| විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | 1,2 | |
| පැය / மணித்தியாலம் / Hours | 2 | |

**සැලකිය යුතුයි: සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. අංක 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. කතෝලික අපගේ විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වන්නේ,
   (1) දස පනත ය. (2) ක්‍රිස්තුන් වහන්සේය (3) ශුද්ධ බයිබලය යි. (4) ශුභාරංචි 4 ය.

2. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමට අයත් පොත් අඩංගු පිළිතුර වන්නේ ,
   (1) මීකා , ජෙරමියා , ජාකොබ්, ගීතාවලිය
   (2) ජොෂුවා , ජුද් , මකබි , නික්මයාම
   (3) ගණන් කතාව , වංශාවලිය , එපීස , නික්මයාම
   (4) රුත්ගේ කතාව , ශෙපනියා , සාමුවෙල් , සිරාක්

3. ඉශ්‍රායෙල් ඉතිහාසයේ කේන්ද්‍රීක සිද්ධිය කුමක්ද?
   (1) නික්මයාම සිද්ධිය (2) මිනිසා මැවීම
   (3) ආබ්‍රහම් තුමාගේ කැඳවීම (4) නෝවාගේ කතාව

4. අයකැමියෙකු විසින් ලියන ලද ශුභාරංචිය වන්නේ
   (1) ශුද්ධ වූ ලූක් ශුභාරංචිය (2) ශුද්ධ වූ මතෙව් ශුභාරංචිය
   (3) ශුද්ධ වූ ජොහන් ශුභාරංචිය (4) ශුද්ධ වූ මාක් ශුභාරංචිය

5. ශුභාරංචිය රචනා කිරීම සඳහා ශුද්ධ වූ පේදුරු තුමන්ගෙන් තොරතුරු ලබා ගත්තේ,
   (1) ශුද්ධ වූ මතෙව් ශුභාරංචිය (2) ශුද්ධ වූ මාක් ශුභාරංචිය
   (3) ශුද්ධ වූ ජොහන් ශුභාරංචිය (4) ශුද්ධ වූ ලූක් ශුභාරංචිය

6. දේව ආදරයේ සලකුණ වන්නේ,
   (1) දේව මැවිල්ල (2) දේව මාතාවන් (3) නවීන තාක්ෂණය (4) අපගේ දක්ෂතාවය

7.

| දිනය | මැවිල්ල |
|---|---|
| 1 දිනය | A ................................ |
| 3 දිනය | B................................ |
| 6 දිනය | c............................ |

A- සතුන් හා මිනිසා
B- දවාල හා රාත්‍රිය
C- ගොඩබිම හා ගස්කොළන්

ඉහත හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු අනුපිළිවෙලින් ඇති වරණය වන්නේ
   (1) සතුන් හා මිනිසා , ගොඩබිම හා ගස්කොළන් , රාත්‍රිය හා දවාල
   (2) සතුන් හා මිනිසා , ගොඩබිම හා ගස්කොළන් , දවාල හා රාත්‍රිය
   (3) දවාල හා රාත්‍රිය , සතුන් හා මිනිසා , ගොඩබිම හා ගස්කොළන්
   (4) දවාල හා රාත්‍රිය , ගොඩබිම හා ගස්කොළන් , සතුන් හා මිනිසා

8. දූවිල්ලෙන් සෑදූ මිනිසා ජීවමාන පුද්ගලයෙක් වූයේ,
   (1) දේව ස්වරූපය අනුව මැවූ නිසාය (2) ලෝකය පාලනයේ වගකීම පැවරූ නිසාය.
   (3) මිනිසා මත ජීවන හුස්ම හෙලූ නිසාය (4) අන් මැවිලි වලට වඩා මනහර වූ නිසාය.

9. ගැලවුම් කරුවාණන්ට " ජේසුස් " යන නම තැබුවේ කිනම් දිවැසිවරයාගේ දිවැසි වැකියට අනුවද?
   (1) ජෙරමියා දිවැසිවරයා (2) හොසියා දිවැසිවරයා
   (3) යෙසායා දිවැසිවරයා (4) එසකියල් දිවැසිවරයා

10. ජුදා ජාතිකයන්ගේ ආගමික චාරිත්‍රයක් නොවන්නේ ,
   (1) ඥාතීන් හට දරුවා ඉදිරිපත් කිරීම (2) නම් තැබීම
   (3) චර්මඡේදනය (4) දරුවන් දේව මාළිගයේ ඔප්පු කිරීම

<u>**11 සිට 15 දක්වා වඩාත් ගැළපෙන වචනය යොදා හිස්තැන් පුරවන්න.**</u>
( දෙව් මවුන් නිර්මල පිළිසිදීමේ , ශුද්ධාත්ම වරම් , අභිවෘද්ධි ආලේපය , නෙබුකද්නේශර් , විද්‍යාත්මක පර්යේෂණයේ , දාවිත් රජ)

11. ....................................... යනු එක වරක් පමණක් ලබා ගත හැකි දේව ප්‍රසාද නිධානයකි.

12. ප්‍රසාද ස්නාපනයේදී ශුද්ධ වූ තෛලය භාවිතා කිරීමෙන් ............................ ලැබීම සංකේතවත් කරයි.

13. ලන්චියනෝ නුවර දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යය පිළිබඳව 1978 දී සිදු කරන ලද .............................. දී නැවුම් රුධිරයේ මෙන් ඛනිජ ද්‍රව්‍ය අඩංගු බව ප්‍රකාශ කරන ලදී.

14. ............................ විසින ෂාද්‍රාක් , මේෂක් හා අබෙද්නෙගෝ හට රන් රූපයට වන්දනා කරන්නට අණ කරන ලදී .

15. ................................. මංගල්‍යය දෙසැම්බර් 08 වැනිදා දින සමරනු ලබයි.

<u>**16 සිට 20 දක්වා ප්‍රකාශන හරි ද ( √) වැරදි ද ( ×) යන්න ලකුණු කරන්න.**</u>

16. අපල මුදු පැළඳීම තුන්වන දේව පනතට විරුද්ධ ක්‍රියාවකි. (...........)

17. " ස්වාමිනී, අපටත් යාච්ඤා කරන්න ඉගැන්නුව මැනව. " යි නිකදේමුස් විසින් ඉල්ලා සිටියේය.(...........)

18. ප්‍රැන්සිස් හා ජසින්තා යන දරුවන්ට දේව මාතාවන් පාතිමා නුවරදී දර්ශනය වූ සේක. (..........)

19. නැති වූ බැටළුවා පිළිබඳ උපමාව යාච්ඤා කිරීමේ වැදගත්කම පිළිබඳව ක්‍රිස්තුන් වහන්සේ වදාළ උපමාවකි. (............)

20. ගීතාවලියේ 51 ගීතිකාව පව් කමාව ගැන කියවෙන ගීතිකාවකි. (................)

## 2 කොටස

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**

1.

(1) උත්පත්ති පොතෙහි අඩංගු කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) ශු.ජොහන් ශුභාරංචියේ සලකුණ හා එම සලකුණ භාවිතා කිරීමට හේතුව ලියන්න . (ලකුණු02)

(3) මිනිසා විසින් දේව මැවිල්ල විනාශ කරන අවස්ථා දෙකක් ලියන්න. ( ලකුණු 2)

(4) ක්‍රිස්තුන් වහන්සේ මෙන් ඔබටත් දෙවියන් වහන්සේගේ ප්‍රසාදය ලබමින් ( අධ්‍යාත්මය) වර්ධනය වන්නට කළ හැකි දේවල් 2 ක් ලියන්න. (ලකුණු 2)

(5) සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කළේ කවුරුන් විසින්ද? කිනම් අවස්ථාවේදීද? (ලකුනු 2)

(6) රෝගීන්ගේ ආලේපය ලබා දෙන අවස්ථාවේ දී එම ස්ථානය සූදානම් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ දේවල් අතරින් 2 ක් සඳහන් කරන්න.
(ලකුණු 2)

(7) 6 වන දේව පනතට අනුව අප ජීවත් විය යුතු ආකාර 2 ක් ලියන්න. (ලකුණු 2)

(8) ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ අවස්ථාවන් 2 ක් සඳහන් කරන්න. ( ලකුණු 2)

2. (1) පංච පුස්තකය සඳහා භාවිතා වන වෙනත් නම් 2 ක් ලියන්න. (ලකුණු 2)

(2) ශුද්ධ වූ ලූක් තුමා දක්ෂතාවය දැක්වූ ක්ෂේත්‍ර 3 ක් ලියන්න. ( ලකුණු 3)

(3) දෙවියන් වහන්සේගේ ආදරය ශුද්ධ බයිබලය තුළින් අපට පෙන්වා දෙනු ලබයි. එම ආදරය පාසලේ දී ඔබ අන් අයට පෙන්වන ආකාර 6 ක් ලියන්න. (ලකුණු 6)

3. (1) මිනිසා අන් මැවිලි වලට වඩා උසස් මැවිල්ල වීමට හේතු කාරණා 2 ක් ලියන්න. (ලකුණු 2)

(2) දෙවියන් වහන්සේ මිනිසාව මවා ඔහු වෙත පැවරූ වගකීම් 3 ක් ලියන්න. (ලකුණු 3)

(3) දෙවියන් වහන්සේ අපට බාරදී ඇති මේ ලස්සන මැවිල්ලආරක්ෂා කරන්නට පාසල් සිසුවෙකු වන ඔබට කළ හැකි දේවල් 6 ක් ලියන්න. (ලකුණු 6)

4. (1) සේවය සදහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක මොනවාද? ( ලකුණු 2)

(2) දේව ප්‍රසාද නිධානයක දක්නට ඇති ප්‍රධාන ලක්ෂණ 3 ක් ලියන්න. (ලකුණු3)

(3) පාපොච්චාරණ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමේ වැදගත්කම,පාපොච්චාරණය සක්‍රමේන්තුව ලබා නොගන්නා ඔබේ මිතුරෙකුට පහදා දෙන්න. (ලකුණු 6)

5. (1) අන් දෙවිවරුන්ට වන්දනා නොකරන ලෙසට අපට නියම කරන දස පනතට අයත් පනත් දෙක ලියන්න. (ලකුණු 2)

(2) කතෝලික අපට ශ්‍රී ලංකාව තුළ නියමව ඇති ණය මංගල්‍යයන් , දිනයන් සමඟ සඳහන් කරන්න. (ලකුණු3)

(3) ඉරුදින නිවසට වී කම්මැලිකමින් සිටින ඔබගේ කතෝලික මිතුරාට ඒ දිනය ශුද්ධවන්තව ගත කරන්නට කළ හැකි දේවල් 6 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 6)

6. (1) ගොඩමස් වලින් වැලකිය යුතු දින 2 ක් ලියන්න. (ලකුණු 2)

(2) එක්වරුශීල රැකීමේ පරමාර්ථයන් 3 ක් ලියන්න. (ලකුණු 3)

(3) කොරෝනා වසංගතයෙන් අප රට මුදවා ගන්නා ලෙස ඉල්ලමින් දෙවි පියාට ඔප්පු කිරීමට සුදුසු යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ලකුණු 6)

7. (1) දේව මාතාවන් දර්ශනය වූ ස්ථාන 2 ක් නම් කරන්න (ලකුණු 2)

(2) නමෝ මරිය යාච්ඤාවේ කොටස් තුන මොනවාද? (ලකුණු 3)

(3) මරිය තුමිය දේව කැමැත්තට සෑම මොහොතකදී ම අවනත වූවාය. මරිය තුමිය මෙන් සිසු දරුවෙකු ලෙස ඔබ දෙවියන් වහන්සේට කීකරු වන ආකාරය කරුණු 6 කින් විස්තර කරන්න. (ලකුණු 6)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
Year End Evaluation - 2021

| ශ්‍රේණිය / தரம் / Grade | 6 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | 1,2 | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

## පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1. (3) | 6. (1) | 11.අභිවෘද්ධි ආලේපය | 16. × |
| 2. (4) | 7. (4) | 12. ශුද්ධාත්ම වරම් | 17. × |
| 3. (1) | 8. (3) | 13. විද්‍යාත්මක පරීක්ෂණයේ | 18. √ |
| 4. (2) | 9. (3) | 14. නෙබුකද්නේශර් | 19. × |
| 5. (2) | 10.(1) | 15. දෙවිමවුන් නිර්මල පිළිසිඳීමේ | 20. √ |

## 2 කොටස

1. (1) දෙවියන් වහන්සේ විශ්වය මැවීම, ආදම් ඒව පාපයට වැටීම, කායින් ආබෙල් කතාව , නෝවා සහ ජල ගැලීම , බාබෙල් කොත පිළිබඳ කතාව , ආදි පිතෘවරයන් පිළිබඳ දෙවිපියා තැබූ විශ්වාසය (6 පෙළ පොත පිටු අංක 6)

(2) සංකේතය: රාජාලියා /හේතුව :තේරුම් ගැනීමට අපහසු සංකල්පනාවකින් ආරම්භ වීම - පිටු අංක 10

(3) පරිසර දූෂණය/ වනාන්තර විනාශය/ පොලිතින් භාවිතය / වැනි පරිසර විනාශ කරන ක්‍රියාකාරකම් අඩංගු පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න (6 පෙළ පොත පිටු අංක19)

(4) යාච්ඤා කිරීම /ආගමික පොතපත කියවීම/ දේවස්ථානයේ සමිති සමාගම් වලට සහභාගී වීම/ වැනි අධ්‍යාත්මික වර්ධනයට හේතුවන ක්‍රියාකාරකම් සඳහා ලකුණු දෙන්න(පිටු අංක34)

(5) පාස්කු ඉරුදින උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ අපෝස්තුළුවරුන්ට දර්ශනය වෙමින් (6 පෙළ පොත පිටු අංක 49)

(6) කුරුසිය /පහන/ පියතුමාට අත සෝදා ගැනීමට අවශ්‍ය ජලය/අත් පිස්නය(6 පෙළ පොත පිටු අංක51)

(7) අසභ්‍ය වචන කතා නොකිරීම/ අසභ්‍ය පොත පත නොබැලීම/ පිරිසිදු සිතකින් ජීවත් වීම (6 පෙළ පොත පිටු අංක78,60)

(8) බව්තීස්මය ලබා දීමේදී / සුවය දානය කිරීමට පෙර / අපෝස්තුළුවරුන් තෝරා ගැනීමට පෙර /පේදුරු තුමාගේ මහා ප්‍රකාශයට පෙර/ ස්වාමිවාක් ආරාධනය ඉගැන්වීමට පෙර හා මෙවැනි නිවැරදි පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න. (6පෙළ පොත පිටු අංක 96,97)

2/

(1) ව්‍යවස්ථාවලිය / මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාවලිය / නීතිය / මෝසෙස් තුමාගේ නීතිය /ටෝරා(6 පෙළ පොත පිටු අංක5)

(2) වෛද්‍යවරයෙකි / ඉතිහාසඥයෙකි / චිත්‍ර ශිල්පියෙකි (6පෙළ පොත පිටු අංක9)

(3) පාසල තුළ දේව ආදරය අන් අයට පෙන්වීමට කළ හැකි යහපත් ක්‍රියා 6 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

3/ (1) දේව ස්වරූපයට හා දේව සමානකමට මවා තිබීම/ මනුෂ්‍යා මවා ඔහුගේ නාස්පුඩු තුළට ජීවන හුස්ම හෙළීම/ මැවූ දිනය “මනහර“ බව ප්‍රකාශ කිරීම / මිනිසා සතුන්ව නම් කිරීම (පිටු අංක23)

(2) A- දරු සම්පත් ලැබීමට

B-පොළොව පුරා පැතිර යන්නට * පොළොව වගා කිරීමට

C- සියලු සතුන් පාලනයට * අස්වැන්න ප්‍රයෝජනයට ගැනීමට (6 පෙළ පොත පිටු අංක19)

(3) පාසලේ සිසුවකු ලෙස මැවිල්ල රැක ගැනීමට කළ හැකි දේ 6 ක් උදා: පරිසරය දූෂණය නොකිරීම/ වන විනාශය නොකිරීම / කසල ක්‍රමවත්ව බැහැර කිරීම වැනි දේ සඳහා ලකුණු දෙන්න.

4/ (1) පූජකවරය හා ආශීර්වාදකාර බන්ධනය, (6 පෙළ පොත පිටු අංක39)

(2) ඇතුළාන්තයෙන් දෙන දේව වරප්‍රසාදය ගැන බාහිරින් සලකුණු කිරීම /ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කර තිබීම/සංඥා පිළිවෙත් අඩංගු වීම (6 පෙළ පොත පිටු අංක37)

(3) සමඟි සන්ධානයේ ප්‍රසාද නිධානයෙන් එක්නෙකා සමඟ සම්බන්ධ වීමට හැකි වීම/සදාතන දඬුවමින් මිදීම/සිත් සාමය ලැබීම/කාලීන දඬුවමින් මිදීම/අධ්‍යාත්මික ශක්තිය ලැබීම යන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (6 පෙළ පොත පිටු අංක50)

5./ (1) සැබෑ වූ එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරන්න/ දෙවියන්ගේ ශ්‍රී නාමය ගැන බොරුවටවත් නිරන්තරයටවත් නොදිවුරන්න. (6 පෙළ පොත පිටු අංක62)

(2) සැම ඉරුදිනයක් ම / ජනවාරි 01 ; පරිශුද්ධ දේව මාතා මංගල්‍යය /

අගෝස්තු 15 : මරිය තුමියගේ ස්වර්ගාරෝපණ මංගල්‍යය /

දෙසැම්බර් 08 : දේව මාතාවන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය /

දෙසැ 25: නත්තල් මංගල්‍යය

(3) රෝගී වූවන් බැලීමට යාම / දහම් පාසලින් දැනුම වර්ධනය කර ගැනීම / මුළු දිව්‍ය පූජා යාගයට සහභාගී වීම/ අසරණයින්ට පිහිට වීම / සමිති සමාගම් සඳහා සහභාගී වීම ( පිටු අංක 71)

6/ (1) අළු බදාදා/ මහ සිකුරාදා , අවුරුද්දේ සැම සිකුරාදාවක්ම (6 පෙළ පොත පිටු අංක89)

(2) තමන්ගේ පාප වලට වන්දි ගෙවීම / ආත්ම දමනය පුහුණු වීම/ නිරාහාරව සිටි ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කිරීම (6 පෙළ පොත පිටු අංක89)

(3) ලියා ඇති යැදුම අනුව ලකුණු දෙන්න.

7/ (1) දොමිනික් ගුස්මාන් පියතුමන්ට / පාතිමා නුවරදී , ලූර්දු නුවර දී / ඉන්දියාවේ වේලක්කන්නි නුවරදී(6 පෙළ පොත පිටු අංක207 ,108)

(2) *ගාබ්‍රියල් දේව දූතයා මරිය තුමියට මංගලම් කීම ඇසුරින් පළමු කොටස

* එළිසබෙත් තුමියගේ ආචාරය පදනම් කර ගනිමින් දෙවන කොටස

* ශුද්ධ වූ සභාව විසින් එක් කළ තුන්වන කොටස(6 පෙළ පොත පිටු අංක 109 )

(3) දෙවියන් වහන්සේට කීකරු විය හැකි ආකාර ලියා ඇති පිළිතුරු සලකා ලකුණු දෙන්න.